# A Source Study of *Madhyamaka* Traditional Teachings on Being and the World

## සත්ත්වයා හා ලෝකය පිළිබඳ මධ්‍යමක සම්ප්‍රදායාගත ඉගැන්වීම් පිළිබඳ මූලාශ්‍රයාගත අධ්‍යයනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

### මධ්‍යමක සම්ප්‍රදාය හැඳින්වීම

මහායාන සම්ප්‍රදායේ ආරම්භක නිකායයක් ලෙසට මධ්‍යමක ගුරුකුලය හැඳින්වේ. මෙම සම්ප්‍රදාය බිහිවීම සඳහා මහාසාංඝික නිකායේ ඉගැන්වීම් මූලබීජ වූ බව කිව හැකිය. එහෙත් මධ්‍යමක ගුරුකුලය දර්ශනයක් ලෙසට ක්‍රි.පූ. 01 වන සියවස වනවිට ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවන්නේ ආර්ය නාගර්ජුන පාදයන්ට ය. එතුමා එකල පැවති ආත්මවාදය ඛණ්ඩනය කිරීමට බෞද්ධ අනාත්ම දර්ශනය දෙසට නොහැරී සාපේක්ෂකවාදය ඉගැන්වෙන ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කරගත්හ.[1] එබැවින් බෞද්ධ දර්ශන සම්ප්‍රදායන් අතර මධ්‍යමක දර්ශනය නමින් දැක්වෙන්නේ ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කර ගත් සාපේක්ෂක වාදයයි.

මධ්‍යමක දර්ශනය පිළිබඳ සිද්ධාන්ත බුද්ධ කාලයටත් පෙර සිට පැවතෙන්නේ යැයි විචාරක මතය වුවද, නාගර්ජුන පාදයන් මධ්‍යමක දර්ශනය ගොඩනගන්නේ බුද්ධ දේශිත ප්‍රතීත්‍යසමුත්පාදයෙනි. මේ අනුව සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය විවරණය කිරීමේ දී ස්ථවිරවාදීන්ගේ සහ ආභිධර්මිකයන්ගේ විවරණය අනුව, ආදි බුදුසමය යනු පුද්ගල නෛරාත්ම්‍ය වාදයක් හා ධර්ම අනිත්‍යත්ව වාදයක් ලෙස සංක්ෂිප්තව දැක්විය හැකිය. එහෙත් මේ අයුරින් ධර්ම විවරණය කිරීමේ දී බුද්ධ මතය ඉදිරිපත් නොවන බව සැළකූ මධ්‍යමකයන් "ශූන්‍ය" යන වචනයට අවධානය යොමු කළහ. ඔවුහු සත් - අසත් යන ශාස්වත උච්ඡේද  අන්තවලට නොවැටී බුද්ධ වචනය ව්‍යාඛ්‍යාන කරන්නට වූහ.[2] මෙසේ අන්තවලට නොවැටී මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන හෙයින් ද ඔවුහු මධ්‍යමකයන් ලෙස හඳුන්වා ඇත.[3] එසේම නිරන්තරයෙන් සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය, හේතුඵල සම්බන්ධය, සංසාරය, දුක ආදී නිවනින් මෙපිට ඇති කවර කරුණක් වුව ද ඔවුහු පටිච්චසමුප්පාදයට අනුගතව ම විග්‍රහ කරති.[4] එහෙයින් ද ඔවුන් මධ්‍යමක නාමයෙන් ව්‍යවහාර කොට ඇත. මෙම දර්ශනයට අනුව ශූන්‍යතාව ලෝකෝත්තර සත්තාවක් නොවේ. ශූන්‍යතා සංකල්පය තුළින් අපේක්ෂිත අරමුණ වන්නේ, ධර්ම නෛරාත්මතාව, නිශ්ස්වභාවය, පරස්පරාපේක්ෂිත බව ප්‍රකට කිරීමය.

ශූන්‍යතාව, මධ්‍යම ප්‍රතිපදාව, සාපේක්ෂතා සංකල්පය නිර්මාණය වීමේලා පටිච්චසමුප්පාද න්‍යාය භාවිත වී ඇත.[5] යමක් පටිච්චසමුප්පාද වේ නම්, එය ශූන්‍යතාව යැයි කියමු. ඒ ශූන්‍යතා ප්‍රඥප්තිය නිසා "මධ්‍යමක" නම් වේ.[6] මධ්‍යමක දර්ශනයට අනුව ලෝකයේ ඉහත සංකල්පවලට යටත් නොවූ කිසිවක්

නොමැත. අහේතුක වූ අප්‍රත්‍යය වූ කිසිවක් ලෝකයේ විද්‍යමාන නොවේ. **"අප්‍රතීත්‍ය සමුප්පන්නෝ - ධර්මඃ කශ්චින්න විද්‍යතේ, යස්මාත් තස්මාද් ශූන්‍යොහි - ධර්මඃ කශ්චින්න විද්‍යතේ"**[7]

මධ්‍යමක දර්ශනය තුළ මූලික සංකල්ප වලට කේන්ද්‍ර වූ ආගමික දාර්ශනික පදනමක් මෙන් ම ආචාර විද්‍යාත්මක පදනමක් ද අන්තර්ගත ය. ශූන්‍යතාව යනු හුදු සාරධර්ම විද්‍යාව අර්ථවත් කරන පදයක් ම නොවන අතර එහි සාරධර්ම හැඟවීමක් නැත්තේ ම ද නොවේ. ආනුභූතික සියලු දේ සාරවූ යථාර්ථයෙන් බැහැරවන හෙයින් වටිනාකමින් තොරය. සත්ත්වයා ලෞකික දේ සමඟ බැඳීම් ඇතිකර ගැනීම නිසා ශූන්‍යතා අර්ථය වරදවා ගනී. මේ නිසා සාරධර්ම කෙරේ අවධානය යොමු නොවේ. නමුත් ආදානග්‍රාහී නොවී ශූන්‍යතා අර්ථය වටහාගනී නම් සමාජ ආචාරධර්ම නිතැතින්ම සුරක්ෂිත වන බව මධ්‍යමක දර්ශනය අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

මධ්‍යමකයන් ඉදිරිපත් කරන මූලික සිද්ධාන්තයන් සංක්ෂිප්තව මෙසේ දැක්විය හැකිය.

- ප්‍රත්‍ය සතරක් පමණක් ලෝකයේ විද්‍යමාන වේ. පස්වැනි වූ ප්‍රත්‍යයක් ලෝකයේ නැත.
- නිර්වාණය අනාලම්බන ධර්මයකි.
- භාවයන්ගේ සත්තාවක් නැත.
- යැම යනුවෙන් අදහස් කරන ක්‍රියාවක් ද නැත්තේ ය.
- සංසාරයෙහි ආදියක් හෝ අන්තයක් නැත.
- ලෝකයේ සංවෘති පරමාර්ථ යනුවෙන් සත්‍ය දෙකකි.
- ශූන්‍ය නොවූ කිසිවක් ලොව විද්‍යමාන නොවේ.
- ශූන්‍යතාව වරදවාගත් තැනැත්තේ ධර්ම විනාශය කරයි.
- පංචස්කන්ධයෙන් වෙන් වූ ආත්මයක් නැත.
- නිර්වාණය භාව ධර්මයක් නොවේ.
- ක්ලේෂ නිර්වෘතියට නිර්වාණය යැයි කියනු ලැබේ.
- තථාගත තෙමේ ද ස්වභාව ශූන්‍ය වේ.
- බුදුරදුන් විසින් ආත්ම අනාත්ම යැයි කිසිවක් දේශනා නොකරන ලදී.
- පරමාර්ථය අවබෝධ නොකොට නිර්වාණය අවබෝධ කළ හැකි නොවේ.
- එලය හැම ලෙසින් ම ශූන්‍ය වේ.[8]

## සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පිළිබඳ මධ්‍යමක ඉගැන්වීම

බුද්ධකාලීන භාරතීය සමාජය තුළ සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය, එහි ආරම්භය අවසානය පිළිබඳ විවිධ දෘෂ්ටි ගහණයන් ප්‍රචලිතව පැවතුණි. එවැනි සමාජ සංදර්භයක් තුළ බුදුන්වහන්සේ අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානු යෝගය යන අන්තවලට නොගොස් තමන්වහන්සේ විසින් අවබෝධ කර ගන්නා ලද නවතම ප්‍රතිපදාවක් හඳුන්වා දුන්හ. මධ්‍යම ප්‍රතිපදාව

නම් වූ මෙම මාර්ගය අවබෝධ කරගත් ආර්ය නාගර්ජුන පාදයන් ඇතුළු මධ්‍යමක ආචාර්යවරු සියලු අන්තවාදයන් හා දෘෂ්ටිවාදයන් පසෙකින් තබා පටිච්චසමුප්පාදය ප්‍රමුඛ කර ගනිමින් මධ්‍යස්ථ වූ මතවාදයන් ඉදිරිපත් කිරීමට මධ්‍යමක දර්ශනය තුළ උත්සාහ දරා තිබේ. ඒ බව ඔවුන්ගේ මූලග්‍රන්ථයක් වන මූලමධ්‍යමක කාරිකාව තුළින් වඩාත් පැහැදිලි වේ.[9] මධ්‍යමක දර්ශනය බිහිකිරීම, වර්ධනය කිරීම හා සුපෝෂණය කිරීමේ ගෞරවය ආචාර්ය නාගර්ජුන පාදයන්ට හිමිවේ. උන්වහන්සේ පෙන්වා දෙන ලද ශූන්‍යතාවාදය භාව විශෝධන ක්‍රමයක් වේ. එනම් සංකල්ප හැඟීම් ආවේග පිරිසිදු කර ගැනීමයි. මේ ක්‍රමවේදය තුළින් සාර්විකතාව (විශ්ව සාධාරණ) හා නිශ්චිතතාව ලබා ගැනීමට හැකි වේ. දාර්ශනික සංකල්ප තුළින් මෙය ලබා ගත නොහැකි ය. සංකල්ප ශූන්‍යත්වයෙන් එය ලබා ගත හැක. මෙය සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පැහැදිලි කිරීමට මධ්‍යමකයන් භාවිත කරන මූලික සිද්ධාන්තය වේ. මේ නිසා මධ්‍යමකයන් නාස්තිකවාදීන් ලෙස සමහරු හුවා දක්වති. නමුත් නාගර්ජුන පාදයන් ලෝක ස්වභාවය විශ්ලේෂණය කිරීමේ දී "ශූන්‍යතාව" යන දාර්ශනික අර්ථයෙන් පැහැදිලි කරනුයේ සාමාන්‍ය ව්‍යවහාරයේ එන "හිස්බව" යන අදහසින් නොවේ. එය විරහිත තත්ත්වයට තුඩු දෙන අදහසකි.[10] ශූන්‍යතාව නාගර්ජුන පාදයන් විසින් දාර්ශනික වශයෙන් සංස්කෘත ධර්ම පක්ෂයෙහි "ස්වභාව ශූන්‍යතාව"(සත්භාවයෙන් තොර බව) ලෙස ද අසංස්කෘත ධර්ම පක්ෂයෙහි "ප්‍රපඤ්ච ශූන්‍යතාව" (බහුත්වයෙන් තොර බව) ලෙස ද දක්වනු ලබයි. මේ නිසා ශූන්‍යතාව නාස්තිකවාදයක් නොවේ. එසේ හැඳින්වීම සදොස් සහිත වේ.[11]

මූලික වශයෙන් "ලෝකය" ලෙස හඳුන්වන්නේ අනවරත සිද්ධි මාලාවකි. මෙම ක්‍රියාවලියේ එක් කොටසක් "මම" ලෙසින් හඳුන්වයි. "මම" යන්නට සාපේක්ෂකව මගෙන් පිටත ක්‍රියාවලිය "බාහිර ලෝකය" ලෙස නම් කෙරේ. මේ සබඳතාව තහවුරු කිරීම පිණිස තවත් සංකල්ප ගොඩනගා ගත යුතු වේ. මෙම සංකීර්ණ තත්ත්වයන් තුළින් සංසාරය ගොඩනැගේ. මෙසේ විභජනය කරන්නේ අප විසින් ම ය. සමස්ත ක්‍රියාවලිය තුළ "මම" යනුවෙන් යථාර්ථයක් නැති අතර, ඇත්තේ ක්‍රියාවලියක් තුළින් අප තනාගත් සංකල්ප පමණි.

බෞද්ධ මතය හරහා සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පිළිබඳ අදහස් වඩාත් හොඳින් පැහැදිලි කළේ නාගර්ජුන පාදයන් ය. මෙම සමස්ත ක්‍රියාවලිය වැරදි ලෙස වටහා ගැනීම හේතු කර ගෙන සත්ත්වයෙක්, පුද්ගලයෙක් ඇත යන වැරදි ආකල්ප ගොඩනගා ගන්නා බව නාගර්ජුන පාදයෝ පෙන්වා දෙති. උන්වහන්සේ ශූන්‍යතාව ඇසුරු කර ගෙන වැරදි ආකල්ප ගොඩනගා ගන්නා ස්වභාවය මධ්‍යමක කාරිකාවේ තථාගත පරීක්ෂාවේ මෙසේ දක්වා ඇත. **"තථාගත තෙමේ යම් ස්වභාවයක් ඇත්තේ වේ, එහෙයින් මේ ලෝකයත් ඒ ස්වභාවය ඇත්තේ ය. තථාගත තෙමේ නිඃස්වභාවය. එහෙයින් මේ ලෝකය ද නිඃස්වභාව වේ." "යම් කෙනෙක් ප්‍රපඤ්චාතීත වූ අව්‍යය වූ බුදුරදුන් ප්‍රපඤ්ච සහිත කොට දක්වත් ද, ප්‍රපංචයන් නිසා නැසුණු ඒ සියල්ලෝ තථාගතයන් නොදකිත්."**[12]

ශූන්‍යතාවාදයට අනුව ඉන්ද්‍රිය ප්‍රත්‍යයක්ෂය තුළ ගොඩනැගෙන්නා වූ සියලු භාවයන් ස්වභාව වශයෙන් ප්‍රතිබිම්භ හා සමාන ය.[13] ලෝකය මායා ස්වරූපයෙන් ගන්නා මධ්‍යමකයෝ පදාර්ථයන්ගේ සත්තාවය ස්වප්නයෙන් දුටු පදාර්ථයන්ගේ සත්තාවක් ලෙස දැක්වූහ.[14] මේ තුළින් **පුද්ගල නෛරාත්මය**

මෙන්ම **ධර්ම නෛරාත්මය** ද පිළිබිඹු වේ. මෙය තවදුරටත් පැහැදිලි කරනු වස්, නාගර්ජුන පාදයන් චක්ෂුන්ද්‍රිය පරීක්ෂාවේ දී, **"ඇස ආදී ඉන්ද්‍රියන් ප්‍රත්‍යයන් කොට ගෙන විඥානය උපදී. යම්තාක් ඒ විඥානය නූපදී ද එතෙක් චක්ෂුරාදීහු කෙසේ නම් ප්‍රත්‍ය වේද?"**[15]

යනුවෙන් දක්වන මෙම කාරණාව මගින් පැහැදිලි කෙරෙනුයේ ඇස ආදී ඉන්ද්‍රිය හයත් ඒවායේ දැකීම ආදී කාර්යයන් හා අරමුණු ආදියත් ය. මේවා පිළිබඳ ස්වභාවවාදී අර්ථකථනය පිළිගන්නේ නම් ඉන්ද්‍රියක් හෝ තදනුබද්ධ කාර්යයක් පැවැතිය නොහැකිය. ඒ බව පෙන්වා දෙන නාගර්ජුන පාදයෝ අනතුරුව දක්වන්නේ විඥානය හෝ විඥානයට අනුව ඇති වෙතැයි සළකනු ලබන නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන ආදී සියලු ධර්ම පැවතිය නොහැකි බවයි.[16] එනම් ඒවා පිළිබඳ ස්වභාවවාදී අර්ථකථන ප්‍රතික්ෂේප කරන බවයි.

බෞද්ධ දර්ශනය තුළ සත්ත්වයා ස්කන්ධ, ධාතු, ආයතන වශයෙන් විග්‍රහ කර දැක්වේ. එහි පරමාර්ථය වන්නේ සත්ත්වයා තුළ ආත්මයක් හෝ සද්භාවයක් නොමැති බව දැක්වීමයි. පශ්චාත්කාලීන ආභිධම්මික ඉගැන්වීම් තුළ මෙම ස්කන්ධ, ධාතු, ආයතනාදිය "ධර්ම" ලෙස විස්තර කරනු ලැබේ. නමුත් නාගර්ජුන පාදයන් මූලමධ්‍යමක කාරිකාවේ ස්කන්ධ පරීක්ෂාවේ දී හා ධාතු පරීක්ෂාවේ දී විචාරයට ලක්කරන්නේ ධර්ම වර්ගීකරණය යි. ස්කන්ධ පරීක්ෂාවේ දී රූපස්කන්ධය පමණක් පරීක්ෂාවට භාජනය වුව ද, එම පරීක්ෂණය සියලු ස්කන්ධ කෙරේ අදාළ වේ.[17] මෙහි දී නාගර්ජුන පාදයන් මුලින් ම රූපය හා රූප කාරණ හෙවත් රූපයේ අංග දෙක දක්වා, එහි අවියෝජනීය සබඳතාව පෙන්වා දෙයි. මෙහි සමස්ත සාකච්ඡාවට පදනම් වූ හේතුඵලවාදය පිළිබඳ පාරභෞතික සිද්ධාන්ත දෙක ප්‍රතික්ෂේප කරනු අයුරුද දැකගත හැක. එනම්,

01. ඵලය හා හේතුව අනන්‍ය සේ පිළිගනු ලබන සත්කාර්යවාදයත්

02. ඵලය හා හේතුව එකිනෙකින් වෙනස් සේ පිළිගනු ලබන අසත්කාර්යවාදයත් ය.

මෙම දෙකම ලුහුඬුකම් සහිත මතවාද වන අතර, මින් එකකින් හෝ සත්‍යතාව අවබෝධ කළ නොහැක. නමුත් නාගර්ජුන පාදයන් ශූන්‍යතාව උපයෝගී කර ගනිමින් රූපස්කන්ධය බැහැර කරන අතර, අනෙක් ස්කන්ධයන් ද පෙර කී ලෙස බැහැර කරණු ලබයි. එසේම මීට එරෙහිව කිසිවෙකුට ස්කන්ධ පවතින්නේ යැයි උපන්‍යාසයන් ගොඩනැගිය නොහැකි බව මෙම පරීක්ෂාවේ දී පැහැදිලිව දක්වා ඇත.[18]

සත්ත්වයාගේ හා ලෝකයේ සංයුතිය පැහැදිලි කරමින් නාගර්ජුන පාදයන් ධාතු පරීක්ෂාව ද ඉදිරිපත් කර තිබේ. මෙහි දී මූලික සූත්‍ර දේශනා තුළ හා අභිධර්මයේ විස්තර වන දහඅටක් ධාතු විමර්ශනය නොකෙරේ. මෙහි ෂඩ් ධාතු, අංග ලෙස යොදා ගැනේ. එනම් පෘථිවි, ආප්, තේජස්, වායු, ආකාශ හා විඥාන වේ. ඒවා ස්වභාවවාදී ආකාරයෙන් තේරුම් ගැනීමේ වරද මෙහි දී පෙන්වා දේ. ශූන්‍යතාවෙහි බලපෑමට හසු නොවන්නා වූ කිසිදු ප්‍රස්තුතයක් තිබිය නොහැක. ස්ව-භාව අර්ථයෙන් ඉදිරිපත් කරන සෑම දෙයක්ම ඊට අයත් වේ. මෙහි දී ඒ සඳහා උපයෝගී කර ගනු ලබන්නේ ලක්ෂ්‍ය හා

ලක්ෂණ යන සංකල්පයයි.[19] මෙම සංකල්ප දෙකේ පරස්පර සාපේක්ෂතාව පෙන්වා දීම තුළින් නාගර්ජුන පාදයන් ආකාශ ධාතුව පමණක් නොව අන් සියලු ධාතූන් ද සත් වශයෙන් නොපවත්නා බව දක්වයි. මේ සඳහා මූලික මෙවලම ලෙස ශූන්‍යතාව උපයෝගී කර ගෙන තිබේ.

ශූන්‍යතාව යනු ප්‍රතීත්‍යසමුත්පාදය බවත්, ශූන්‍යතාව යනු සාපේක්ෂතාව බවත් ඉන් අදහස් කරන්නේ මධ්‍යම ප්‍රතිපදාවත් වේ. මේ සත්‍ය විශ්වයේ සියලු සංස්කාර ධර්මයන් කෙරේ සාර්වභෞමික වශයෙන් බලපවත්වයි. මේ බව නාගර්ජුන පාදයෝ මධ්‍යම කාරිකාවේ සංස්කාර පරීක්ෂාවෙහි දක්වයි. සංස්කාර ලෙස දැක්වෙන්නේ කාය, වාග් හා මනස් සංස්කාර වේ. එනම් හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියලු දේ සංස්කාර වේ. මෙහි නාගර්ජුන පාදයන් මූලිකව ම විචාරයට ලක් කරන්නේ "යථාර්ථය තුළ පවතී යැයි විශ්වාස කරනු ලබන නොමඟ යවන සුළු ස්වභාවයයි."[20] එසේ මුලාවට පත් කරන බැවින් සංස්කාර අසත්‍යය නම් එබඳු ධර්මයක් ලෙස දැක්විය හැකි යමක් නොමැත.[21] එනම් ඒවා හුදෙක් ශූන්‍ය වේ.

අනතුරුව සංස්කාර ධර්මවල මූලික ලක්ෂණ ලෙස දක්වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන කරුණු තුනෙන් අනිත්‍යතාව සංස්කාර සම්බන්ධයෙන් ස්ව-භාවවාදී අර්ථයකින් යෙදිය නොහැකි ආකාරය පැහැදිලි කරයි. මෙහි දී සංස්කාර ධර්මයන් නිරතුරුවම වෙනස්වීම තුළින් ඒවායේ ස්ව-භාවයක් නොමැති බව ගම්‍ය වේ. ස්වභාවයෙන් තොරව නම් "භාව" යැයි කථා කළ හැකි යමක් තිබිය නොහැකි ය. ස්වභාවයෙන් තොර වීම නම් ශූන්‍යතාවයි. එනම් ස්වභාවයක් නැති කළ භාවයක් නැත. එකල්හි අනිත්‍යතාවක් ගැන කතා කළ නොහැක. අනිත්‍යතාව අදාළ නොවන්නේ නම් අනෙක් ලක්ෂණ ද්වය නිරායාසයෙන් අදාළ නොවේ.[22]

විශ්වයෙහි හා සියලුම සවිඤ්ඤාණික අවිඤ්ඤාණික වස්තූන් ආත්ම යැයි කියා හෝ ද්‍රව්‍ය ආදී නමින් හෝ හැඳින්විය හැකි කිසිම ස්ථිර අචල තත්ත්වයක් ඇත්තාහු නොවෙති. එහෙයින් සියලු වස්තූන් සාපේක්ෂකය. සියලු වස්තු ශූන්‍යය.[23]

සියල්ල අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් පවතී. ස්වතන්ත්‍රව පවත්නා කිසිවක් නැතැයි නාගර්ජුන පාදයන් ඉගැන්වීය. විශ්වය හා එහි පවත්නා සියලු සවිඤ්ඤාණික අවිඤ්ඤාණික වස්තු ආත්මීය වශයෙන් හැඳින්විය නොහැකිය. ඒ කිසිවක ස්ථිර පැවැත්මක් නොමැත. එබැවින් සියල්ල ශූන්‍ය වේ. සමස්ත විශ්වය ම සටනා ප්‍රපංචයක් විනා වස්තු සමූහයක් නොවේ. උප්පත්තිය, ස්ථිතිය, විනාශය අත්‍යමාත්ව ලක්ෂණ ඇති කිසිවක් සත්තාවක් නැතිබව නාගර්ජුන පාදයෝ අවධාරණය කරති. සියලු සත්ත්වයින්ගේ ස්වභාවය හේතු ප්‍රත්‍ය අපේක්ෂාවෙන් ම සිදුවෙයි. මෙයින් අහේතුකවාද, ඒකහේතුවාද, විෂමහේතුවාද සියල්ල ඛණ්ඩනය වේ. **"ඒවං ප්‍රතීත්‍යසමුප්පාද ස්‍යයෝ්ර්ථඃ ස ඒව ශූන්‍යතා - ශබ්දස්‍යාර්ථඃ න පුනරාභව ශබ්දස්‍ය යෝ්ර්ථඃ"[24]**

ශූන්‍යතා ලක්ෂණයට හසු නොවන කිසිවක් නොමැති බවත් ශූන්‍යතාව යන්න කිසියම් දෘෂ්ටියක් නොවන බවත් පුන පුනා නාගාර්ජුන පාදයෝ ඉදිරිපත් කොට තිබේ. ඒ අනුව අධ්‍යාත්මික බාහිර වන සියල්ල ශූන්‍ය වන්නේ නම්, උද-ව්‍යය දෙකක් නැත්තේ ය. ඒ දෙක ද ශූන්‍යතා ගුණයෙන් යුක්ත ය. දුක්ඛ,

සමුදය, නිරෝධ, මාර්ග යැයි කියන්නා වූ චතුරාර්ය සත්‍ය ශුන්‍යතා ගුණයෙන් යුක්ත බව මධ්‍යමක අදහසයි. **"යදි ශුන්‍ය මිදං සර්ව - මුදයො නාස්ති නව්‍යයඃ, චතුර්ණා මාර්ග සත්‍යානා - මහාවස්තේ ප්‍රසජ්‍යතේ "**[25]

නාගර්ජුන පාදයන් විසින් ඉදිරිපත් කරන ශුන්‍යතාව තුළින් ශාස්වත, උච්ඡේදවාදයක් ඉදිරිපත් නොවේ. උන්වහන්සේ ඉදිරිපත් කිරීමට උත්සාහ ගෙන ඇත්තේ මමායනයෙන් හා අස්මිමානයෙන් මිදී සියලු දේ අනාත්ම දෘෂ්ටිකෝණයකින් බලා අවබෝධ කොට ගත යුතු බවයි. මෙවැනි අවබෝධයක දී සාමාන්‍යයෙන් ලෝක ව්‍යවහාරයේ පිළිගන්නා සාමාන්‍ය අනුභූතියට හසුවන ඉන්ද්‍රිය ගෝචර වස්තු කිසිවක් නැතැයි පිළිගත යුතු බව නාගර්ජුන පාදයන් දක්වන්නේ නැත.

නාගර්ජුන පාදයන් සත්‍යයේ ප්‍රභේද දෙකක් දක්වයි. එනම් ලෝකය හා සම්බන්ධ වූ ව්‍යවහාර සත්‍යයත්, පරමාර්ථ සත්‍යයත් ය.[26] මෙහි ව්‍යවහාරය හෙවත් සම්මුතියේ පවතින සියලු දේ මමායනයෙන් මෙහෙයවන දේ ලෙස සළකයි. ශුන්‍යතාව උපායමාර්ගයක් කොට ගෙන සියල්ලෙහි සත්‍ය අවබෝධ කිරීමට උත්සාහ ගෙන ඇත. එය පරමාර්ථ සත්‍යයි.

මධ්‍යමකයන් විසින් මේ ආකාරයට සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය විවරණයට පටිච්චසමුප්පාද දේශනාව ඉදිරිපත් කළ ආකාරය පිළිබඳ මොරටුවේ සාසනරතන හිමියෝ මෙසේ අදහස් ඉදිරිපත් කරති.

"ප්‍රතීත්‍යසමුත්පාදයෙන් උගන්වන පරිණාමවාදය යථා විධියෙන් විග්‍රහ කළේ මධ්‍යමකයන් විසිනි. මධ්‍යමකයන් ශුන්‍යතාව නමින් හඳුන්වන පරිණාමවාදය බෞද්ධ දෘෂ්ටිකෝණයෙන් බලා කළ විග්‍රහයකි. මෙතැන දී එක් කරුණක් සිහිපත් කළ යුතුව ඇත. එනම් ස්ථවිරවාදීහු පටිච්චසමුප්පාදය සත්ත්වයා පමණක් විග්‍රහ කිරීමට යොදා ගත් සත්ත්ව පරිණාම දර්ශනයක් මෙන් සළකති. එහෙත් මධ්‍යමකයෝ ඒ පටිච්චසමුප්පාදයම හේතුඵලවාද සහ ශුන්‍යතා නාමයෙන් ගෙන ද්‍රව්‍ය ලෝක හා ජීව ලෝකයේ පරිණාමය දක්වති."[27]

මෙයින් පැහැදිලි වන්නේ පටිච්චසමුප්පාදය හෙවත් ශුන්‍යතාව සත්ත්ව පරිණාමය හෝ ද්‍රව්‍ය පරිණාමය පමණක් ඉදිරිපත් කරන දහමක් නොව, විශ්වයේ ආරම්භය හා අවසානය දක්වා විස්තර කරන දහමක් බවයි. විශ්වයේ ආරම්භය හා අවසානය විවිධ විචාර අනුව සියල්ල ඊශ්වර නිර්මාණවාදීව ඉදිරිපත් කොට තිබේ. එහෙත් ලෝකයේ සිදුවීම් පටිච්චසමුප්පාදය අනුව විවරණය කිරීම තුළින් ලෝකයේ ආරම්භය මෙන්ම විනාශය ද දෙවියන්ගේ ක්‍රියාවක් නොවන බව ගම්‍ය වේ. සියල්ල සාපේක්‍ෂක වේ.

මධ්‍යමක දර්ශනයේ ප්‍රධාන සිද්ධාන්තයට අනුව සැළකීමේ දී අයින්ස්ටයින්ගේ හා නාගර්ජුන පාදයන්ගේ සාපේක්‍ෂතා වාද දෙකම එකිනෙකට සමාන වුවද, ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සීමාවන් අනුව විමසීමේ දී පෙනෙන්නේ ආචාර්ය නාගර්ජුනගේ සාපේක්ෂතාවාදය මූලික වශයෙන් ජීවලෝකය ද සම්පූර්ණයෙන් ගත් කළ සමස්ත විශ්වය ද නිර්ණය කිරීම සඳහා යොදා ගත් බවත් පරමාර්ථ සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා ශුන්‍යතාවාදය ඉදිරිපත් කොට ඇති බවත් ය. අයින්ස්ටයින්ගේ

සාපේක්ෂතාවාදයෙන් කෙරෙනුයේ භෞතික ලෝකයේ තත්ත්වාකාරය පිළිබඳ සාපේක්ෂ විසඳීකරණයක් ඉදිරිපත් කිරීමය. මේ අනුව පටිච්චසමුප්පාදය = ශූන්‍යතාව = සාපේක්ෂතාවය = මධ්‍යමප්‍රතිපදාව වේ. ලෝකයේ ස්වභාවය පිළිබඳ මධ්‍යමක විවරණය තවදුරටත් අධ්‍යයනය කිරීමේ දී එය මෙසේ ද විස්තර වේ. "නිත්‍ය ස්වභාවයාගේ අභාවය "ශූන්‍යතාව" නම් වේ. මෙම ශූන්‍යතාව ඒකත්වය, අව්‍යාකෘත්‍ය, අසඞ්ඛ්විතය, අනුප්පාදය, අසම්භය, විරාගය, නිරෝධය, නිර්වාණය, අද්වය, අනුත්පන්න, නිර්විකල්ප, භූතතථතා, තථාගතගර්භ, අපරප්‍රත්‍ය, යන පර්යාය නම්වලින් හැඳින්වේ."[28] "ශූන්‍යතාව සාපේක්ෂක වේ. එබැවින් වචනයෙන් විස්තර කළ නොහැකි ය. අවාච්‍ය, අනභිලාප්‍ය වේ."[29]

නාගර්ජුන පාදයන්ගේ දර්ශනය තේරුම් ගැනීමේලා අතිශය වැදගත් සාධක අතර එතුමන්ගේ අතිශය තීරණාත්මක ප්‍රකාශයන් ද වේ. ඉන් කියවෙන පරිදි ශූන්‍යතාව යනු සියලු දෘෂ්ටීන්ගෙන් මිදීම වේ. සියල්ල ශූන්‍ය ලෙස ගෙන ශූන්‍යතාව පමණක් ස්ථාවරව ගන්නේ නම් එය ද බරපතල වරදක් බව මූලමධ්‍යමක කාරිකාවේ සංස්කාර පරීක්ෂාවේ දක්වයි. සියලු භාවයන් ශූන්‍ය වේ නම් ශූන්‍යතාව ද ශූන්‍ය වේ ද? යැයි අසන ප්‍රතිවාදියාට පිළිතුරු දෙන නාගර්ජුන පාදයන්ගේ පහත ප්‍රකාශය තුළින් සමස්ත දර්ශනයේ හරය ගැබ් වී ඇත.

"ශූන්‍යතාව යනු අස්ව -භාවත්වය තේරුම් ගැනීමට භාවිත කරන්නා වූ උපකරණයක් පමණක් බවයි. ශූන්‍යතාව සංකල්පයක් ලෙස ගතහොත් අනෙකුත් සියලුම සංකල්ප මෙන් ම ශූන්‍ය ය. ශූන්‍යතාව එක් අතකට අප යොමු කරවන්නේ එක්තරා ආකාරයක ජීවිතාකල්පයක් දෙසට ය. එය ඇති කර ගත් පසු ලෝකය පිළිබඳ දෘෂ්ටිය හා අපගේ චර්යාව වෙනස් වේ. එවිට ශූන්‍යතාවේ කාර්යය අවසන් වේ. එමඟින් දෘෂ්ටීන්ගෙන් මිදුණු පුද්ගලයා තුළ ඇතිවන විමුක්ති ස්‍රාවය පමණක් රැඳී පවතී.

1 සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය විදුලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස්. බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පි.301.

2 සාසනරතන හිමි, මොරටුවේ, මූලමාධ්‍යමික කාරිකාව 15-xx ගාථාව,පි. 1963, පිට.136.

3 පඤ්ඤාසේන හිමි, ගාල්ලේ, ශූන්‍යවාදය, විදුලකර ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස්. බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පිට.309.

4 මේධානන්ද හිමි, දේවාලේගම, චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය, ආරිය ප්‍රකාශන, 1989, පිට,84.

5 **Singh, Jaidev (1968) An Introduction to Madyamaka Philosophy, Motilal bansidass, p.23.**

6 යං ප්‍රතීත්‍ය සමුප්පාදඃ - ශූන්‍යතාං තං ප්‍රචක්ෂ්මහෙ
සා ප්‍රඥප්ති රූපාදාය - ප්‍රතිපති සෛව මධ්‍යමා
ශාසනරතන හිමි, මොරටුවේ, මූඃමාඃකාඃ 24- 18 , පි.160 ගාථාව, පී ජේ රුද්‍රිගො ප්‍රකාශන, 1963.

7 ශාසනරතන හිමි, මොරටුවේ, මූඃමාඃකාඃ 24- xix ගාථාව, පී ජේ රුද්‍රිගො ප්‍රකාශන, 1963.

8 වනරතන හිමි, ඉත්තදෙමලියේ, බෞද්ධ සම්ප්‍රදායන් අතර මාධ්‍යමිකයන්ට හිමි තැන, බෞද්ධ සංස්කෘතිය, පිට. 217-218

9 අස්තීත්ව ශාස්වතග්‍රාහෝ - නාස්තීත්ව අච්ඡේද දර්ශනම්- තස්මා අස්තීත්ව නාස්තීත්ව- නාස්ශ්‍රියේතවිදක්ෂණඃ, ශාසනරතන හිමි,
මොරටුවේ, මූඃමාඃකාඃ 1-v ගාථාව, පී. ජේ. රුද්‍රිගෝ, පානදුර, 1963,

10 පඤ්ඤාසේන හිමි, ගාල්ලේ, ශූන්‍යවාදය, ප්‍රඥාසාර ප්‍රශස්ති, සංස්. බඹරැන්දේ සිරි සීවලී හිමි, 1996, පිට, 310.

11 නවයං නාස්තිකාඃ අස්තිත්ව නාස්තිත්ව ද්වයවාදනිරාසෙන
තුවයං නිර්වාණ පුරගාමීනමද්වයපථං විද්‍යොතයාමඃ නච
කර්මකර්තෘඵලාදිකං නාස්තීති බ්‍රූමඃ කි තර්හි නිඃස්වභාව මෙතදිති ව්‍යවස්ථාපයාමඃ
මාධ්‍යමික වෘත්ති, පිට.329.

12 තිලකරත්න, අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය,තථාගත පරීක්ෂාව 15-16 කාරිකා, 2001. පිට,142.

13 සවෛභාවඃ ස්වභාවෙන ප්‍රතිබිම්බ සමාමතඃ
නාගර්ජුන හිමි මූමධ්‍යමික කාරිකා (සංස්.) ශාසනරතන හිමි, මොරටුවේ, පී. ජේ. රුද්‍රිගෝ, පානදුර, 1963, පිට 65.

14 යථා මායා යථා ස්වප්නො - ගාන්ධර්ව නගරං යථා
නථොත්පාදස්තථා ස්ථානං - තථා භඞග උදාහෘතම්
මූලමධ්‍යමික කාරිකා, සංස්කෘත, පරීක්ෂා ප්‍රකරණ, 34 කාරිකා

15 සාසනරතන හිමි, මොරටුවේ, මූඃමාඃකාඃ 1-v ගාථාව, පී. ජේ. රුද්‍රිගෝ, පානදූර, 1963,
උත්පද්‍යතේ ප්‍රතිත්‍යෙමාතීතිමෙප්‍රත්‍යයාඃ කිල
යාවන්නොත් පද්‍යතේ ඉමෙ - තාවන්න ප්‍රත්‍යයාඃ කථම්

16 මූලමධ්‍යමික කාරිකාව, සංස්, සාසනරතන හිමි, මොරටුවේ 3-8 කාරිකාව, පිට, 80.

17 මූලමධ්‍යමික කාරිකාව, සංස්, සාසනරතන හිමි, මොරටුවේ 3-8 කාරිකාව, පිට, 82.

18 "ව්‍යාඛ්‍යානෙය උපාලම්භං - කෘතෙ ශූන්‍යතයා ජායතේ
සර්වං තස්‍යානුපාලබ්ධං - සමං සාධ්‍යෙන ජායතේ"
මූලමධ්‍යමික කාරිකාව, සංස්, සාසනරතන හිමි, මොරටුවේ , 4-9 කාරිකාව.

19 එම, 5-1, 2 කාරිකා.

20 එම, 13 -1 කාරිකා.

21 එම, 13 -2 කාරිකා.

22 එම, 13 -3,4,5 කාරිකා.

23 රාහුල හිමි, අත්තුඩාවේ. බුද්ධ ධර්මය සංස්කෘතිය, රත්නජෝති ප්‍රකාශකයෝ, 1970, පිට 261.

24 අභයවංශ කපිල, බෞද්ධ අධ්‍යයනය, ගොඩගේ, පි. 147, 1999.

25 ශාසනරතන හිමි, මොරටුවේ, මූ:මා:කා:, පී.ජේ. රුද්‍රිගෝ ප්‍රකාශන 1963, 24-1.

26 "ද්වෙ සත්‍ය සමුපාශ්‍රිත්‍ය - බුද්ධානං ධර්ම දේශනා
ලොක සංවෘති සත්‍යංච - සත්‍යංච පරමාර්ථතඃ"
ශාසනරතන හිමි, මොරටුවේ, මූ:මා:කා:, පී.ජේ. රුද්‍රිගෝ ප්‍රකාශන, 24-8 කාරිකාව, 1963.

27 ශාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, අතුල ප්‍රකාශන , පි.75, 1970.

28 විජිත හිමි, පිටිගල, මහායාන මාධ්‍යමික සම්ප්‍රදායගත ශූන්‍යතා දර්ශනය සම්මුති 1, සංස්. උණුවතුර බුබුලේ මහින්ද හිමි, සංස්කාරක ප්‍රකාශන, 2001, පිට 80.

29 මේධානන්ද හිමි, දේවාලේගම, පටිච්චසමුප්පාදය හා ශූන්‍යතා දර්ශනය, සාරදා, 2007, පිට 21.